**01.** **ජීව පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.**

2026.02.13 දින වත්තල පොලිස් වසමේ ගාල හන්දිය ප්‍රදේශයේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ජීව පතරොම් තිබූ පාර්සලයක් පොලිස් භාරයට ගෙන වැඩිදුර විමර්ශන සිදුකර ඇත.

බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් සිදුකරන ලද විමර්ශනයට අනුව ටී56 ජීව පතරොම් 04 ක්, රිවොල්වර වර්ගයේ ජීව පතරොම් 04 ක්, පිස්තෝල වර්ගයේ ජීව පතරොම් 02 ක් හා විවිධ වර්ගයේ සිම්පත් 11 ක් තිබී ඇති අතර මෙම පතරොම් තොගය සඟවා තබන බවට සැකකරන පුද්ගලයෙකු සැඟවී සිටියදී 2026.02.15 දින අළුයම දෙල්වල පොලිස් වසමේ උදාතලගම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 35 ක් වන පොල්පාගොඩ, යක්කලමුල්ල ප්‍රදේශයේ පදිංචි හිටපු යුධ හමුදා සෙබලෙකු වේ.**

මෙම සැකකරු හට ගල්නෑව, කල්තොට හා ඇල්පිටිය පොලිස් වසම්වලට අදාල ගරු අධිකරණ වලින් දින වරෙන්තු හා විවෘත වරෙන්තු නිකුත් වී ඇති පුද්ගලයෙකු බවට අනාවරණය වී ඇත. සැකකරු සම්බන්ධයෙන් තවදුරටත් දීර්ඝ විමර්ශන සිදුකිරීමට ගරු අධිකරණය මඟින් පැය 72 ක රැඳවුම් නියෝග ලබාගැනීමට නියමිතව ඇත. බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

***உயிர் குண்டுகளுடன் சந்தேகநபர் கைது – மேல் மாகாண வடக்கு குற்றப்பிரிவு***

*2026.02.13 அன்று வத்தள பொலிஸ் பிரிவிற்குட்பட்ட காலி சந்தி பகுதியில், மேற்கு மாகாண வடக்கு குற்றப்பிரிவு அதிகாரிகளுக்கு கிடைத்த தகவலின் பேரில் சுற்றிவளைப்பு மேற்கொள்ளப்பட்டது. இதன்போது உயிர் குண்டுகள் அடங்கிய ஒரு பார்சல் பொலிஸ் காவலில் எடுக்கப்பட்டு மேலதிக விசாரணைகள் மேற்கொள்ளப்பட்டன.*

*மேற்கு மாகாண வடக்கு குற்றப்பிரிவு அதிகாரிகள் மேற்கொண்ட விசாரணையின் அடிப்படையில் T-56 வகை உயிர் குண்டுகள் 04, ரிவால்வர்*

*வகை 04, பிஸ்தல் வகை 02 மற்றும் பல்வேறு வகையான 11 சிம் அட்டைகள் கண்டுபிடிக்கப்பட்டன. இக்குண்டுகளை மறைத்து வைத்திருந்ததாக சந்தேகிக்கப்படும் நபர் 2026.02.15 அதிகாலை தெல்வல பொலிஸ் பிரிவிற்குட்பட்ட உதாதல்கம பகுதியில் ஒளிந்து கொண்டிருந்தபோது கைது செய்யப்பட்டார்.*

*சந்தேகநபர் 35 வயதுடைய, பொல்பாகொட, யக்கலமுல்ல பகுதியைச் சேர்ந்த முன்னாள் இராணுவ சிப்பாய் ஆவார்.*

*மேலும், கல்நேவ, கல்தொட்ட மற்றும் அல்பிட்டிய பொலிஸ் பிரிவுகளுக்குட்பட்ட மதிப்பிற்குரிய நீதிமன்றங்களால் இவருக்கு எதிராக திறந்த மற்றும் தேதி குறிப்பிட்ட பிடியாணைகள் பிறப்பிக்கப்பட்டுள்ளன என்பது தெரியவந்துள்ளது. மேலதிக விரிவான விசாரணைகளுக்காக 72 மணி நேர தடுப்பு உத்தரவைப் பெற நீதிமன்றத்தில் முன்வைக்கப்பட உள்ளது. மேற்கு மாகாண வடக்கு குற்றப்பிரிவு மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகிறது.*

## Suspect Arrested with Live Ammunition – Western Province North Crime Division

On 13.02.2026, officers of the Western Province North Crime Division carried out a raid in the Gala Junction area within the Wattala Police Division, acting on a tip-off. During the operation, a parcel containing live ammunition was seized and taken into police custody for further inquiry.

Subsequent investigations by the officers led to the recovery of 04 rounds of T-56 ammunition, 04 rounds of revolver-type ammunition, 02 rounds of pistol-type ammunition, and 11 SIM cards of various types.

In the early hours of 15.02.2026, a suspect believed to have concealed the said stock of ammunition was apprehended in the Udathalagama area of the Delwala Police Division.

The arrested individual is a 35-year-old former Army soldier residing in Yakkalamulla, Polpagoda.

Investigations have further revealed that the suspect is wanted on day warrants and open warrants issued by the Honorable Magistrates’ Courts of the Galnewa, Kalthota, and Elpitiya Police Divisions.

A 72-hour detention order is to be obtained from the Honorable Court to facilitate further interrogation and investigations.

Further inquiries are being conducted by the Western Province North Crime Division.

## 02. හදිසි අනතුරකින් පුද්ගලයෙකු ජීවිතක්ෂයට - වාරියපොල පොලිස් වසම.

2026.02.15 දින උදෑසන බමුණකොටුව කළුගමුව මාර්ගයේ කඩපැත්වෙහෙර ප්‍රදේශයේදී කළුගමුව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියැදුරට රථය පාලනය කරගැනීමට නොහැකිව පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියැදුරු හා පසුපස ගමන් ගත් කාන්තාවක් තුවාල ලබා වාරියපොල රෝහලට ඇතුළත් කිරීමෙන් පසු ත්‍රීරෝද රථයේ රියැදුරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 80 ක් වූ කොස්වත්ත, පනාදරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රෝගී තත්ත්වයට ප්‍රතිකාර ලබා නැවත නිවස කරා යමින් සිටියදී මෙලෙස අනතුරට ලක්ව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

*விபத்தில் ஒருவர் உயிரிழப்பு – வாரியப்பொல பொலிஸ் பிரிவு*

*2026.02.15 அன்று காலை பமுனாகொட்டுவ-களுகமுவ வீதியின் கடபெத்தவெஹெர பகுதியில், களுகமுவ நோக்கி பயணித்த முச்சக்கர வாகனம் ஓட்டுநரால் கட்டுப்படுத்த முடியாமல் கவிழ்ந்து விபத்து ஏற்பட்டது.*

*இந்த விபத்தில் முச்சக்கர வாகன ஓட்டுநரும் பின்னால் பயணித்த பெண்ணும் காயமடைந்து வாரியப்பொல வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டனர். பின்னர் ஓட்டுநர் மேலதிக சிகிச்சைக்காக குருநாகல் வைத்தியசாலைக்கு மாற்றப்பட்டபோதும் உயிரிழந்தார்.*

*உயிரிழந்தவர் 80 வயதுடைய, கொஸ்வத்த, பனாதரகம பகுதியைச் சேர்ந்தவர் ஆவார்.*

*நோய்க்கான சிகிச்சை பெற்றுவிட்டு வீட்டிற்குத் திரும்பியபோது இந்த விபத்து ஏற்பட்டதாக ஆரம்ப விசாரணையில் தெரியவந்துள்ளது.*

*வாரியப்பொல பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.*

**Fatal Road Accident – Wariyapola Police Division**

A fatal road traffic accident was reported on the morning of 15.02.2026 in the Kadapethewehera area along the Bamunakotuwa–Kalugamuwa Road, within the Wariyapola Police Division.

A three-wheeler travelling towards Kalugamuwa reportedly lost control and overturned. As a result of the incident, both the driver and a female passenger sustained injuries and were admitted to the Wariyapola Hospital for medical treatment. The driver was subsequently transferred to the Kurunegala Hospital for further care, where he later succumbed to his injuries.

The deceased was an 80-year-old resident of Koswatta, Panadaragama.

Preliminary investigations have revealed that the victim was returning home after receiving medical treatment for an illness at the time of the accident.

Wariyapola Police are conducting further investigations into the incident.

## 03. කාර් රථයක් යතුරුපැදියක ගැටී යතුරුපැදිකරු හා පසුපැදිකරු ජීවිතක්ෂයට - මාන්කුලම පොලිස් වසම.

2026.02.15 දින දහවල් ඒ09 මාර්ගයේ ජර්මන් ටෙක් හන්දියේදී වව්නියාව දෙසට ධාවනය වූ කාර් රථයක් එම දිශාවටම ඉදිරියෙන් ගමන් කළ යතුරුපැදියක පිටුපස ගැටී යතුරුපැදිය ඉදිරියට තල්ලු වී ගොස් කාණුකට වැටී අනතුරක් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකරු තුවාල ලබා කිළිනොච්චිය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු දෙදෙනාම මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 57 හා 62 වයස්වන පසු වූ කිළිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කාර් රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

### *கார் மோதி மோட்டார் சைக்கிளில் பயணித்த இருவர் உயிரிழப்பு – மாங்குளம் பொலிஸ் பிரிவு*

*2026.02.15 அன்று மதியம் A09 வீதியின் ஜெர்மன் டெக் சந்தியில், வவுனியா நோக்கி பயணித்த கார் ஒன்று அதே திசையில் முன்னால் சென்ற மோட்டார் சைக்கிளின் பின்புறம் மோதியது. இதனால் மோட்டார் சைக்கிள் முன்னோக்கி தள்ளப்பட்டு கால்வாயில் விழுந்து விபத்து ஏற்பட்டது.*

*விபத்தில் மோட்டார் சைக்கிள் ஓட்டுநரும் பின்னால் பயணித்தவரும் காயமடைந்து கிளிநொச்சி வைத்தியசாலையில் அனுமதிக்கப்பட்ட பின்னர் இருவரும் உயிரிழந்தனர்.*

*உயிரிழந்தவர்கள் 57 மற்றும் 62 வயதுடைய கிளிநொச்சி பகுதியைச் சேர்ந்தவர்கள் ஆவர்.*

*கார் ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். மாங்குளம் பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.*

### Car collides with motorcycle, killing motorcyclist and pillion rider - Mankulam Police Division.

On the afternoon of 15.02.2026, a car travelling towards Vavuniya at the German Tech junction on the A09 road collided with the back of a motorcycle travelling in the same direction, pushing the motorcycle forward and falling into a ditch. The

motorcyclist and pillion rider sustained injuries in the accident and were admitted to the Kilinochchi Hospital, where they both died.

The deceased are residents of the Kilinochchi area aged 57 and 62.

The driver of the car has been arrested. The Mankulam Police are conducting further investigations.

## 04. යතුරුපැදියක් ත්‍රීරෝද රථයක ගැටී පසුපැදිකරුවෙකු ජීවිතක්ෂයට - බියගම පොලිස් වසම.

2026.02.15 දින අළුයම නව නුවර මාර්ගයේ සියඹලාපේ හන්දිය අසලදී බණ්ඩාරවත්ත දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් ඉන්ධන හලකට යාමට හැරවීමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් ඉහත ත්‍රීරෝද රථයේ ගැටී අනතුරක් සිදුව ඇත.

යතුරුපැදියේ පැදිකරු සමඟ තවත් පුද්ගලයින් දෙදෙනෙකු ගමන් කර ඇත. අනතුරින් පිටුපස අසුනේ සිටි පුද්ගලයා විසී වී ගොස් හිස මාර්ගයේ වැදීම හේතුවෙන් බරපතල තුවාල ලබා බියගම රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත. යතුරුපැදිකරු හා එහි මැද ගමන් ගත් පුද්ගලයා තුවාල ලබා රාගම රෝහලට ඇතුළත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇත.

**මරණකරු අවුරුදු 19 ක් වූ මීරාවත්ත, වැලිමඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ත්‍රීරෝද රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇත. බියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

### மோட்டார் சைக்கிள் –முச்சக்கர வாகன மோதலில் ஒருவர் உயிரிழப்பு – பியகம பொலிஸ் பிரிவு

*2026.02.15 அன்று அதிகாலை நவநுவர வீதியின் சியம்பலாபே சந்தி அருகே, பண்டாரவத்த நோக்கி சென்ற முச்சக்கர வாகனம் எரிபொருள் நிலையத்திற்குள் திரும்பும்போது எதிரே வந்த மோட்டார் சைக்கிளுடன் மோதியது.*

*மோட்டார் சைக்கிளில் ஓட்டுநருடன் மேலும் இருவர் பயணித்தனர். விபத்தில் பின்புறத்தில் அமர்ந்திருந்தவர் தூக்கி வீசப்பட்டு தலையில் கடுமையாக காயமடைந்து பியகம வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டபின்னர் உயிரிழந்தார். மோட்டார் சைக்கிள் ஓட்டுநரும் நடுவில் அமர்ந்திருந்தவரும் காயமடைந்து ராகம வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டு பின்னர் Colombo National Hospital மாற்றப்பட்டுள்ளனர்.*

*உயிரிழந்தவர் 19 வயதுடைய, மீரவத்த, வெலிமட பகுதியைச் சேர்ந்தவர் ஆவார்.*

*மூன்று சக்கர வாகன ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். பியகம பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.*

**A motorcycle collided with a three-wheeler, killing a passenger - Biyagama Police Division.**

On the morning of 15.02.2026, a three-wheeler heading towards Bandarawatte near the Siyambalape junction on the New Kandy Road was turning towards a petrol station when a motorcycle coming from the opposite direction collided with the said three-wheeler.

Two other people were travelling with the motorcycle rider. The person in the back seat was thrown from the accident and hit his head on the road, and died after being admitted to the Biyagama Hospital. The motorcyclist and the person in the middle were admitted to the Ragama Hospital with injuries and were admitted to the Colombo National Hospital for further treatment.

The deceased is a 19-year-old resident of Meerawatta, Welimada.

The driver of the three-wheeler has been arrested. Biyagama Police are conducting further investigations.

**05. ලොරි රථයක් පදික කාන්තාවකගේ ගැටී පදික කාන්තාව ජීවිතක්ෂයට - කන්දකැටිය පොලිස් වසම.**

2026.02.15 දින උදෑසන බදුල්ල මහියංගණය මාර්ගයේ බලගොල්ල ප්‍රදේශයේදී බදුල්ල දෙසට ධාවනය වූ යතුරුපැදි පටවාගත් ලොරි රථයක් එම දිශාවටම මාර්ගයේ ගමන් කල පදික කාන්තාවකගේ ගැටී ලොරි රථයේ පිටුපස රෝදයට යට වී අනතුරක් සිදුව ඇත. අනතුරින් එම කාන්තාව එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකාරිය අවුරුදු 79 ක් වූ බලගොල්ල, මීගහකිවුල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ලොරි රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇත. කන්දකැටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

***லாரி மோதி பாதசாரி பெண் உயிரிழப்பு – கண்டகெட்டிய பொலிஸ் பிரிவு***

*2026.02.15 அன்று காலை பதுளை-மகியங்கனை வீதியின் பலகொல்ல பகுதியில், பதுளை நோக்கி சென்ற மோட்டார் சைக்கிள்களை ஏற்றிச் சென்ற லாரி ஒன்று அதே திசையில் நடந்துச் சென்ற பாதசாரி பெண்ணை மோதியது. அவர் லாரியின் பின்புற சக்கரத்திற்குக் கீழ் சிக்கி விபத்து ஏற்பட்டது.*

*விபத்தில் அந்த பெண் சம்பவ இடத்திலேயே உயிரிழந்தார்.*

உயிரிழந்தவர் 79 வயதுடைய, பலகொல்ல, மீகஹகிவுல பகுதியைச் சேர்ந்தவர் ஆவார்.

லாரி ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். கண்டகெட்டிய பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.

**Lorry hits pedestrian, woman dies - Kandaketiya Police Division.**

On the morning of 15.02.2026, a lorry carrying a motorcycle heading towards Badulla in the Balagolla area on the Badulla-Mahiyanganaya road collided with a pedestrian who was travelling in the same direction and was crushed under the rear wheel of the lorry. The woman died on the spot.

The deceased was a 79-year-old resident of Balagolla, Meegahakivula area.

The driver of the lorry has been arrested. Kandaketiya Police are conducting further investigations.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

பொலிஸ் ஊடகப் பிரிவு.

**Police Media Division**